## මන්නාරම නගර සභාව .

1 . මූල්‍ය ප්‍රකාශන .

1.1 . මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම .

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 27 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 07 දින ඉදිරිපත් කරන ලදී . වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 මැයි 11 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .

1.2 . මතය .

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මන්නාරම නගර සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට මන්නාරම නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය පකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 . මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම් .

1.3.1 . ගණකාධිකරණ අඩුපාඩු .

වත්කම් සහ වගකීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයන් හි නිරීක්ෂණය ව ගණකාධිකරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ .

| මූල්‍ය ප්‍රකාශන මත වන බලපෑම . | වත්කම් . | | වගකීම් . | |
|---|---|---|---|---|
| | අවස්ථාව සංඛ්‍යාව . | වටිනාකම . රු . | අවස්ථා සංඛ්‍යාව . | වටිනාකම . රු . |
| වැඩියෙන් දැක්වීම් . | 01 | 4,187,696 | 02 | 2,824,582 |
| අත්හැරීම් . | 01 | 190,500 | - | |

1.3.2 . විගණනය සඳහා සාක්ෂි නොමැති වීම .

විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම .

විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.195,597,511 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය .

1.3.3 . අනුකූල නොවීම් .

පහත සඳහන නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන් හි විධිවිධානයන්ට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය .

| | නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව . | | අනුකූල නොවීම . |
|---|---|---|---|
| ( අ ) . | නගර සභා මුදල් රීති 1939 . | | |
| | ii පරිච්ජේදයේ 11 වගන්තිය . | - | අනුමත අයවැය ලේඛණය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි . |
| ( ආ ) . | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි . | | |
| | මු . රෙ . 700 | - | ගිවිසුම් වල පිටපත් විගණනය සඳහා |

ඉදිරිපත් කර නොතිබුණි .

2 . මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය .

2 . 1 . මූල්‍ය ප්‍රතිඵල .

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම් ඉක්ම වූ පුනරාවර්තන වියදම් අතිරික්තය රු.7,401,039 ක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.11,253,107 ක් විය .

2.2 ආදායම් පරිපාලනය

2.2.1 . උසාවි දඩ .

2011 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා ගෙන් සහ අනෙකුත් ආයතන වලින් අය විය යුතු උසාවි දඩ මුදල් ප්‍රමාණය රු.190,500 ක් විය .

2.2.2 . ආදායම් ණයගැතියෝ .

ඉකුත් කාල පරිච්ඡේදය වෙනුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකතුව රු.8,977,171 ක් වූ හඟ තක්සේරු බදු , කුලී , බලපත්‍ර ගාස්තු සහ වෙනත් ආදායම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි .

2.3 . ආර්ථික නොවූ ගනුදෙනු .

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

( අ ) . පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කොළඹට ගමන් කිරීම සඳහා යොදා ගත් පුද්ගලික වාහනයක් සඳහා රු.20,000 ක් ගෙවා තිබුණි .

( ආ ) . උතුරු පළාත් සභා ප්‍රදර්ශනය වෙනුවෙන් බැනර් පිළියෙල කිරීම සඳහා රු.15,000 ක මුදලක් ගෙවා තිබුණි .

2.4 . කාර්ය සාධනය .

-------------------

සභාව මුදල් වර්ෂය ආරම්භයේ ද වාර්ෂික ක්‍රියාකාර සැලැසුමක් පිළියෙල කර නොතිබුණි . එම නිසා අපේක්ෂිත අරමුණු සහ එහි ප්‍රගතිය සොයා දැන ගැනීමට නොහැකි විය .

3. පද්ධති හා පාලන .

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

( අ ) . අයවැය ලේඛණමය පාලනය .
( ආ ) . ගිණුම්කරණය .
( ඇ ) . ආදායම් රැස්කිරීම .
( ඈ ) . ස්ථාවර වත්කම් .
( ඉ ) . විවිධ තැන්පතු .
( ඊ ) . මානව සම්පත් .
( උ ) . ප්‍රදාන සහ පරිත්‍යාග .
( ඌ ) . වාහන උපයෝජනය .

s/s .